**ජනාධිපතිතුමාගේ ශෝක පණිවුඩය**

ශ්‍රී ලංකා ජනාධිපති

இலங்கை சனாதிபதி

**President of Sri Lanka**

## පණිවුඩය

ජගත් සාම ක්‍රියාදාමයට එක්ව ජීවිත පරිත්‍යාග කළ ශ්‍රේෂ්ඨ ශ්‍රී ලාංකික පුත්‍රයින් දෙදෙනා පිළිබඳ පුවත ඇසූ මොහොතෙහිම මා තුළ ඉමහත් කම්පාවක් ඇතිවිය. එහෙත් ඔවුහු සිය ජීවිත පරිත්‍යාග කරන ලද්දේ ජගත් මානව සංහතියේ නිදහස් අරමුණු සාක්ෂාත් කරදීම සඳහා වීම මාගේ ගෞරවාදරයට හේතු වෙයි.

ශ්‍රී ලංකාව ජාත්‍යන්තර ප්‍රජාව සමඟ සහ සංවිධාන සමඟ පවත්නා ගෞරවනීය සබඳතා මූලික කර ගනිමින් මානව නිදහස හා ප්‍රජාතන්ත්‍රවාදයේ හරයන් කෙරෙහි පවතින ගරුත්වය උදෙසා සේවය කිරීම පිණිස ඔවුහු එක්සත් ජාතීන්ගේ සාම සාධක හමුදාවට අනුයුක්තව සිටිය දී මෙම ශෝක ජනක ඉරණමට මුහුණ දී තිබේ.

ශ්‍රී ලංකා යුද හමුදාවේ කපිතාන් එච්.ඩබ්.ඩී. ජයවික්‍රම සහ කෝප්‍රල් එස්.එස්. විජේකුමාර එහි දී තම ජීවිත පූජා කර ඇත. ඊට අමතරව තවත් හමුදා සාමාජිකයන් තිදෙනෙකු එහිදී බරපතළ ලෙස තුවාල ලබා තිබේ. ඔවුන්ගේ එම පරිත්‍යාගයන් වූ කලී ඒකාන්තයෙන්ම ස්වකීය දේශය වෙනුවෙන් සප්‍රයෝජනවත් මෙහෙවරකට කැපවීමෙන් ම සිදුවූවකි.

එදා තම මාතෘභූමියේ නිදහස හා සාමය වෙනුවෙන් අභීතව සටන් කළ ඔවුහු ඒ අභිමානයෙන් ම ජගත් සාම ක්‍රියාදාමයට එක්වූවෝ ය. ස්වාර්ථයෙන් මිදී පරාර්ථය උදෙසා කැප විය හැකි මිනිස්සු කවර දේශයක වුව ද විරළ ය. මේ උදාර ලංකා පුත්‍රයන් මානව ඉතිහාසයට එක්වන්නේ එවන් වීරභූමිකාවක රණවිරුවන් ලෙස ය.

එවන් විරුවන් බිහිකළ දේශයේ ජනාධිපතිවරයා ලෙස, කපිතාන් එච්.ඩබ්.ඩී ජයවික්‍රම හා කෝප්‍රල් එස්.එස්. විජේකුමාර නම් ඒ විශිෂ්ට රණවිරුවන්ගේ අභාවය පිළිබඳව මාගේ බලවත් සංවේගය ඔවුන්ගේ පවුල්වල සියලු සාමාජිකයන් වෙත පළකරමි.

එමෙන්ම මෙම සිදුවීමේ දී තුවාල ලබා මේ වනවිට ප්‍රතිකාර ලබා ගනිමින් සිටින රණවිරුවන් තිදෙනා වෙත ද ඉක්මන් සුවය ප්‍රාර්ථනා කරමි.

මෛත්‍රීපාල සිරිසේන

2019 ජනවාරි මස 27 වන දින

**අනුග්‍රහය:** ජනාධිපති මාධ්‍ය ඒකකය